**03-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පහන් දැල්ලට කැපවන නියම මෙරුන් ඔබයි. ඔබගේ කැප කිරීමේ ස්මාරකය වන්නේ දීපාවලියයි.

**ප්‍රශ්නය:** බාබා තම දරුවන්ට කියන ප්‍රවෘත්ති මොනවාද?

**පිළිතුර:** නිර්වාණ දේශයෙන් ඔබ පහළට බසින්නේ කෙසේද, ඔහු පහළට එන්නේ කෙසේද යන්න බාබා ජීවාත්ම වන ඔබලාට කියා දෙයි. 'මම කවුද, මම මොනවද කරන්නේ, මම රාමාගේ රාජධානිය ස්ථාපනය කරන්නේ කෙසේද සහ රාවණ පරාජය කිරීමට ඔබව දිරිගන්වන්නේ කෙසේද කියා මම ඔබට කියා දෙමි' යැයි ඔහු පවසයි. දැන් ඔය දරුවන් මේ සියලු දේ වටහා ගන්නා අතර ඔබලාගේ ආලෝකයන් දැල් වී තිබේ.

**ගීතය:** ඔබ තමයි මව, ඔබ තමයි පියා...

ඕම් ශාන්ති. ඉතාමත් ආදරණීය ආධ්‍යාත්මික දරුවන් වන ඔබ ගීතය ඇසුවා. ජීවාත්ම වන ඔබ තම භෞතික ඉන්ද්‍රියන් මඟින් ගීතයට ඇහුම්කන් දුන්නා. මෙම ගීතය නිවැරදිව ආරම්භ වනවා. අවසානයට එන විට, 'ඔබගේ දෙපතුල ලඟ සිටින දූවිල්ල මමයි' වැනි භක්ති මාර්ගයට අයත් වචන දක්නට ලැබෙනවා. දැන්, දරුවන් කිසිම කෙනෙකුගේ දෙපතුල ලඟ වැටෙන දූවිල්ල බවට පත් නොවිය යුතුයි. එය වැරදියි. පරම පියා දරුවන් වන ඔබට නිවැරදි වචන කියා දෙනවා. දරුවන් පැමිණි තැනින්මයි පරම පියාත් පැමිණියේ එය ශබ්දය අභිබැවූ නිර්වාණ දේශයයි. සියලු දෙනාම පැමිණියේ කෙසේද කියන ප්‍රවෘත්තිය බාබා දරුවන් වන ඔබට ලබා දි තිබෙනවා. තමන් එන්නේ කෙසේද, පැමිණි විට තමා කරන්නේ මොනවාද යන්න ඔහු ඔබට කියා දී තිබෙනවා. රාමාගේ රාජ්‍යය ස්ථාපනය කිරීම සඳහා, රාවණගේ රාජ්‍යය පරාජය කිරීමට ඔහු ඔබව උනන්දු කරවනවා. රාමාගේ රාජධානිය සහ රාවණගේ රාජධානිය මේ පොළව මත වන බව ඔය දරුවන් දන්නවා. ලෝකයේ අධිපතියන් බවට දැන් ඔබ පත්වෙමින් සිටිනවා. මෙම පෘථිවිය, අහස, සූර්යයා යන සියල්ල ඔබ අතට පත් වේවි. එමනිසා, රාමාගේ රාජ්‍යය මුළු ලොව පුරාවටම වන අතර, රාවණගේ රාජ්‍යය ද මුළු ලොව පුරාවටමත් වන බව කිව හැකියි. රාවණගේ රාජ්‍යයේ මිනිසුන් බිලියන ගණන් සිටිනවා රාමාගේ රාජ්‍යයේ සිටින්නේ ටික දෙනයි. ඉන් පසුව ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වෙන්න පටන් ගන්නවා. රාවණගේ රාජධානියේ මිනිසුන් දුර්ගුණවලින් යුතු නිසා ජනගහනය බොහෝ වැඩි වනවා. රාමාගේ රාජධානියේ ඔවුන් දුර්ගුණ වලින් තොරයි. මෙය මිනිසුන් පිළිබඳ වූ කතාන්දරයයි. එමනිසා, රාමා අසීමිතත්වයේ පාලකයා වන අතර රාවණ ද අසීමිතත්වයේ පාලකයකු වනවා. දැන් ගණන් කළ නොහැකි තරමේ ආගම් ගණනාවක් තිබෙනවා. 'අසංඛ්‍ය වූ ආගම් වල විනාශය' කියා දෙයක් ගැන කියා තිබෙනවා. ගස පිළිබඳ පින්තූරය ද බාබා ඔබට විස්තර කර දී තිබේ. දෂේරා උත්සවය සමරන විට මිනිසුන් රාවණගේ පඹයෙක් පුළුස්සා දමනවා. එය සීමිත පිළිස්සීමක්. ඔබ පිළිබඳ වූ කරුණ අසීමිත වූවක්. භාරතයේ මිනිසුන් පමණයි රාවණගේ පඹයකු පුළුස්සනු ලබන්නේ. විදේශයන්හී පවා, භාරතයෙන් පැමිණි බොහෝ මිනිසුන් සිටින තැන්වල ඔවුන් රාවණගේ පඹයකු පුළුස්සනවා. එය සීමිත දශේරාවක්ය. ඔවුන් රාවණගේ රාජ්‍යය ලංකාවේ තණනවා. ඔවුන් කියනවා ඔහු සීතා පැහැර ගෙන ලංකාවට රැගෙන ගිය බව. එය සීමිත කරුණක්. පරම පියා කියනවා රාවණගේ රාජ්‍යය මුළු ලොව පුරාම තිබෙනවා. රාමාගේ රාජධානිය තව දුරටත් නැහැ. රාමාගේ රාජධානිය කියන්නේ පරමාත්ම දෙවියන් විසින් ස්ථාපනය කරන ලද රාජධානියයි. රාමාගේ රාජධානිය ලෙස හඳුන්වන්නේ ස්වර්ණම යුගයයි. රාමාගේ නම කියන ගමන් මිනිස්සු ඇට මාල කරකවන නමුත් ඔවුන් ඒ මොහොතේ දීම රාම රජු සිහිපත් කරන්නේ නැහැ මුළු ලොවටම සේවය කරන කෙනාගේ ඇට මාලය තමයි ඔවුන් කරකවන්නේ. දෂේරා වලින් පසුව මිනිස්සු දීපාවලී උත්සවය පවත්වනවා. ඇයි ඔවුන් දීපාවලී සමරන්නේ? ලක්ෂ්මී හා නාරායන් යන දේවතාවන්ගේ මෞලි මංගල්‍යය යෙදෙන්නේ එදිනටයි. එම මංගල්‍යය දිනයේ දී ඔවුන් බොහෝ ආලෝක ලබනවා. පළමුව මෞලි මංගල්‍යය පවත්වනවා. දෙවනුව ඔවුන් කියනවා සෑම නිවසකම දීප මාලාවක් තිබිය යුතුයි කියා. එකල සෑම ජීවාත්මයකම ආලෝකය දැල්විලයි තිබුණේ. දැන් සෑම ජීවාත්මයකම ආලෝකය ගිහින්. ඔවුන් කලි යුගයෙහි අන්ධකාර තත්ත්වයට පත්වෙලා. අන්ධකාරය යනු භක්ති මාර්ගයයි. භක්ති කරමින් සිටිනා අතරේ ඔවුන්ගේ ආලෝකය අඩු වී ගොසින්. ඒ දීප මාලාව කෘත්‍රිම එකක්. මෞලි මංගල්‍යය නිසා ගිණි දල්වනවා වැනි දේවල් එහි නැහැ. දීප මාලාවේදි ඔවුන්

ලක්ෂ්මිට ආරාධනා කරනවා ඔවුන් ඇයව වන්දනා කරනවා. එම උත්සවය භක්ති මාර්ගයට අයිති එකක්. ඉතාමත් ලොකු සතුටකින් සිංහාසනය මත වාඩි වී සිටින රජතුමාගේ මෞලි මංගල්‍යය ඔවුන් පවත්වනවා. ඒ සියල්ල සීමිතයි. අසීමිත විනාශයක් දැන් ඇති වෙනවා-සත්‍ය දශේරාව. සියලු දෙනාගේම පහන දැල්වීමට පරම පියා පැමිණ සිටිනවා. උසස්ම ආලෝකයත් සමඟ තමන්ගේ ආලෝකයත් මුසුවෙතැයි මිනිසුන් සිතා සිටිනවා. බ්‍රහ්ම සමාජීන් ඔවුන්ගේ පූද බිම් වල පහනක් නිරන්තරයෙන් දල්වා තබනවා. පහන වටේ කැරකී පහනට අසු වෙන මෙරුන් මෙන් ජීවාත්මයනුත් මහා ආලෝකය සමඟ එකතුවේ යැයි ඔවුන් විශ්වාස කරනවා. මේ සඳහා හොඳ උදාහරණයක් නිර්මාණය වී තිබෙනවා. ඔබ කල්ප භාගයක් පුරා ආදරවන්තියන්ව සිටියා. ඔබ එකම එක ආදරවන්තයා වෙනුවෙන් දැන් කැප වී සිටිනවා. එය පිළිස්සී යාම ගැන කරුණක් නොවෙයි. එම ආදරවන්තයින් තම එකිනෙකාට පමණක් ආදරය කරන නමුත්, මෙහි එකම එක ආදරවන්තයා පමණක් සිටින අතර අනෙක් සියලු දෙනාම ආදරවන්තියන් වනවා. සියලූම ආදරවන්තියන් භක්ති මාර්ගයේ දී එම ආදරවන්තයාව සිහිපත් කරනවා. ඔහු වෙනුවෙන් කැප වීම සඳහා ඔවුන් එම ආදරවන්තයාට මෙහි පැමිණෙන ලෙසට ආරාධනා කරනවා. ඔවුන් කියනවා ඔබ හැර වෙන කිසිවෙකුත් අපි සිහිපත් නොකරන්නෙමු. මෙය භෞතික සෙනෙහසක් නොවෙයි. එම ආදරවන්තයින් ලඟ ඇත්තේ භෞතික සෙනෙහසකි. ඔවුන් නිතරම එකිනෙකා දෙස බලමින් සිටිනවා. එකිනෙකා දෙස බැලීමෙන්ම ඔවුන් මහත් තෘප්තියක් ලබනවා. මෙහි එකම එක ආදරවන්තයා පමණක් සිටිය දී අන් සියලු දෙනාම ආදරවන්තියන් වෙනවා. සියලු දෙනාම පරම පියාව සිහිපත් කරනවා. ඇතැම් අය ස්වභාව ධර්මය වැනි දේ ගැන විශ්වාස කළත් ඔවුන්ගේ දෙතොලින් පිටවෙන වචනය නම් 'දෙවියනි' යන්නයි. සියලු දෙනාම ඔහුට කතා කරනවා අපගේ දුක නිවාලනු මැනවි! භක්ති මාර්ගයේදි ආදරවන්තයාගේ ආදරවන්තියන් රාශියක් සිටිනවා ඇතැම් අය එක් අයෙකුගේ ආදරවන්තියන් වන අතර අනිත් අය වෙනත් කෙනෙකුගේ ආදරවන්තියන් වනවා. හනුමාන්ට ආදරවන්තියන් කී දෙනෙක් සිටිනවාද? සියලු දෙනාම තමාගේ ආදරවන්තයාගේ පින්තූරයක් නිර්මාණය කර එකට ඉඳගෙන එය වන්දනා කරනවා. එය වන්දනා කර ඔවුන් තම ආදරවන්තයාව මුහුදේ ගිල්වනවා. එහි කිසිම තේරුමක් නැහැ. එවැනි දේවල් මෙහි නැහැ. මෙහි ඔබගේ ආදරවන්තයා සැමදා අලංකාරව සිටිනවා ඔහු කවදාවත් අවලස්සන වන්නේ නැහැ. ලස්සන සංචාරකයා වන පරම පියා පැමිණ ඔබ සියලු දෙනාම ලස්සන කරවනවා. ඔබ සියලු දෙනාමත් සංචාරකයින් වනවා නොවේද? ඔබ තම චරිත මෙහි රඟපෑම සඳහා ඈත දුර දේශයේ සිට පැමිණෙනවා. හොඳින් තේරුම් ගන්නා අය පවා මේවා තේරුම් ගන්නේ තමා දරණ උත්සාහයේ පිළිවෙලටයි. ඔබ දැන් ත්‍රිකාල්දර්ශී (තුන් කාලය පිළිබඳ දන්නා අය) වී සිටිනවා. නිර්මාපකයාත් නිර්මාණයේ මුල, මැද සහ අග පිළිබඳවත් ඔබ දන්නවා. එමනිසා, ඔබ ත්‍රිකාල්දර්ශී බ්‍රහ්ම කුමාර සහ කුමාරීන් බවට පත්ව සිටිනවා. එම මිනිසුන් 'ජගත් ගුරු' වැනි ගෞරව නාම ලබනවා මෙන් ඔබ ලබනා නාමයයි මේ. ඔබ ලබන හොඳම නම නම් 'ස්වදර්ශණ චක්‍රධාරි'යන්නයි. බ්‍රහමීණ් වන ඔබ පමණක්ද ස්වදර්ශණ චක්‍රධාරි වන්නේ හෝ නැතිනම් ශිව බාබාත් එසේ වනවාද? (ශිව බාබාත් මෙසේය). ඔව්. ජීවාත්මයක් ස්වදර්ශණ චක්‍රධාරි වන්නේ ශරීරයක් තුළ සිටින විටයි. පරම පියා මොහුගේ ශරීරය තුළට ඇතුල් වී ඔබට පැහැදිලි කර කියා දෙනවා. ශිව බාබා ස්වදර්ශණ චක්‍රධාරි නොවුණේ නම්, ඔහු කොහොමද ඔබව එම තත්ත්වයට පත්කරවන්නේ? ඔහු තමයි උත්තරීතර, ඉහළම ඉහළ ජීවය වන්නේ. මෙය ශරීරය ගැන කියැවෙන්නක් නොවෙයි. උත්තරීතර පරම පියා පැමිණ ඔබව උත්තරීතර කරවනවා. ජීවාත්ම වන ඔබ හැර වෙන කිසි කෙනෙකුට ස්වදර්ශණ චක්‍රධාරි වන්න බැහැ. මොන ජීවාත්මයන්ද? බ්‍රහමීන්වරුන්ගේ ආගමට අයත් අයටයි. ඔබ ක්ෂුද්‍රයන්ගේ ආගමට අත්ව සිටි කාලයේ ඔබ මෙය දැන සිටියේ නැත. දැන් තමයි ඔබ පරම පියා මඟින් මෙය දැන ගන්නේ. මේවා එතරම්ම හොඳ දේවල්ය! මෙයට ඇහුම්කන් දී සතුටට පත්වන අය ඔබයි. පිටත සිටින කාට හෝ මේවා ඇසුනේ නම්, ඔවුන් පුදුමයට පත්වනු ඇත. ඔහෝ! මේ ඥානය බෙහෝ උසස්ය. අච්චා, ඔවුන්ටත් ස්වදර්ශණ චක්‍රධාරි වීමට හැකි අතර, විශ්වයේ පාලකයන්, ලෝක පාලකයන් විය හැකිය. කොහොමනමුත්, ඇතැම් අය මෙතනින් පිටතට ගිය විගසින් සියල්ල අවසන් වෙයි. මායා හරිම ධෛර්යවන්තයි! මෙතනින් ඇසෙන දේ කුමක්ද, ඔවුන් ඒවා මෙතනම දමා යයි. මෙය කුසේ සිටින දරුවෙක් පොරොන්දුක් වනවා වාගේය. කුසෙන් එළියට පැමිණි වහාම ඔහුට එම පොරොන්දුව අමතක වෙයි. ප්‍රදර්ශන වලදී ඔබ මිනිසුන්ට පැහැදිලි කිරීම් කළ විට, 'ඒක හොඳයි, ඒක හොඳයි' කියා ඔවුන් කියනවා. මෙම ඥානය ඉතා හොඳ බවත්, තමනුත් මේ වගේ හොඳ උත්සාහයක් දරමින් මේ මේ දේ කරනා බවත් ඔවුන් පවසනවා. පසුව ඔවුන් ගිය විගස, සැම දේම පසෙක තබනවා. සියල්ල එක වගේයි, ඔවුන් ටිකක් ඒවාට යට වෙනවා. ඔබ වෙත ඔවුන් ආපසු පැමිණෙනු නැතැයි කිව නොහැකියි. ගස දිගටම වර්ධනය වනවා. ගස වර්ධනය වුණායින් පසුව සියලු දෙනාම ඇදී එන්න පටන් ගනීවි. මෙය දැන් අපායේ පතුලම බවට පත් වෙලයි තිබෙන්නේ. ගරුඩා පුරාණයේ බිය ගෙන දෙන සුළු

කතන්දර ලියා තිබෙනවා. මිනිසුන්ගේ හිත්වල බයක් ඇති කරවීම සඳහා මේවා ලියා තිබෙනවා. මිනිසුන් නයි, ගෝනුස්සෝ වැනි තත්ත්වයට පත් වෙනවා කියන කතා සෑදී තිබෙන්නේ ඒ අනුවයි. පරම පියා කියනවා මම ඔබව විෂ සහිත ගංගාවෙන් ඉවතට ගෙන කිරි සයුර වෙත කැඳවා ගෙන යමි. මුල්ම වශයෙන් ඔබ සාම දේශයේ වැසියන්ව සිටියා. එතැනින් ඔබ තමාට අයිති චරිත කොටස රඟපෑමට සතුටේ දේශය වෙතට ගියා. දැන් ඔබ සාම දේශයටත් සතුටේ දේශයටත් නැවතත් ගමන් කරනවා. ඔබට මෙම දේශයන් මතකයි නේද? මිනිස්සු කියනවා, 'මව සහ පියා ඔබයි, ඔබෙන් පමණයි අපි මහත් සතුටක් ලබන්නේ'. කොහොමනමුත්, එම සතුට තිබුණේ ස්වර්ණම යුගයේයි. දැන් එය සංගම යුගයයි. විඳින්නට සිදුවන දුක් කන්දරාව නිසා මෙහි සිටින මිනිස්සු අවසානයේදී මහත් වේදනාවෙන් අඬන්න පටන් ගනීවි. ඉන් අනතුරුව ස්වර්ණම යුගයේදී අතිශය ප්‍රීතියක් ලබනවා ඇත. මෙය අතිශය වූ සතුටත් අතිශය වූ දුකත් පිළිබඳ වන තීරණය වූ නාටකයක්. ඔවුන් විෂ්ණුගේ අවතාර පවා පෙන්වනවා. ලක්ෂ්මී සහ නාරායන් යුවළ ඉහළ සිට පහළට එන ආකාරය ඔවුන් පෙන්වනවා. කොහොමනමුත්, උඩ ඉහළ සිට පහළට ශාරීරික පුද්ගලයින් පැමිණෙන්නේ නැහැ. උඩ ඉහළ සිට පැමිණෙන්නේ ජීවාත්මයනුයි. නමුත් පරමාත්ම දෙවියන්ගේ පැමිණීම අසහායයි. භාරතය දිව්‍ය ලෝකය බවට පත් කරවන්නේ ඔහු පැමිණි විටයි. මිනිස්සු ඔහුගේ උපන් දිනය, ශිව ජයන්තිය සමරණවා. තමාට මුක්තියේ හා ජීවන මුක්තියේ උරුමය දෙන්නේ පරම පියා වන පරමාත්ම ජීවය බව මිනිස්සු දන්නවානම්, මුළු ලෝකය පුරාම ඔහුගේ උපන් දිනය සමරනු ඇත. ගැලවුම්කරු හා මඟ පෙන්වන්නා වන්නේ ශිව බාබායි කියා ඔවුන්ට තේරෙනවා නම්, අසීමිත පියාගේ සිහිවටනය ඔවුන් අනිවාර්යෙන්ම සමරනු ඇත. ඔහුගේ උපත සිදුවන්නේ භාරතයේයි. මිනිස්සු ශිව ජයන්තිය සමරන්නේ භාරතයේයි. කොහොමනමුත්, ඔහු පිළිබඳ සම්පූර්ණ හැඳින්වීම ඔවුනට නොමැති නිසා, නිවාඩුවක්වත් ඇතිව මිනිස්සු එය සමරන්නේ නැහැ. සෑම කෙනෙක්ටම මුක්තිය ලබාදෙන පරම පියාගේ උපන් දිනය හා වන්දනාව අනිවාර්යෙන්ම ඔහු පැමිණ තම අසහාය වූ කාර්යය ඉටු කරනා ඔහුගේ උපන් ස්ථානයේ දී සැමරිය යුතුයි. මෙහි ඇති දේවාලයත් ඔබගේම ස්මාරකයකි. කොහොමනමුත්, මෙහි පැමිණ ගැලවුම්කරු හා මඟ පෙන්වන්නා බවට පත් වන්නේ ශිව බාබායි කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. සෑම කෙනෙක්ම කියන්නේ, 'සෑම දුකකින්ම අපව නිදහස් කරගෙන සතුටේ දේශය වෙත අපව ගෙනයන්න' කියලයි, නමුත්, ඔවුන්ට කිසිවක් තේරෙන්නේ නැහැ. ඉහළම ඉහළ දේශය භාරතයයි. සිහපත් කර ඇති භාරතයේ ප්‍රශංසාව අසීමිතයි. ශිව බාබා උපත ලබන්නේ මෙහියි. නමුත් කිසිම කෙනෙක් ඔහුව විශ්වාස කරන්නේ නැහැ. මිනිස්සු ඔහුගේ මුද්දරයක් හදන්නේ නැහැ. දැන් මෙහි වැදගත්කම මිනිසුන්ට තේරෙන ලෙස ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? සන්‍යාසීන් පිටරට වලට ගොස් භාරතයේ පුරාතන යෝගාව ගැන කියා දෙනවා. ඔබගේ රාජයෝගාව ගැන කියූ විට, ඔබගේ නම කීර්තියට ලක් වේවි. ඔවුන්ට කියන්න රාජයෝගාව ඉගැන්වූයේ කවුද කියා කිසිම කෙනෙක් දන්නේ නැහැ. ක්‍රිෂ්ණා හතා යෝගා ඉගැන්වූයේ නැහැ. සන්‍යාසීන් හතා යෝගා පුහුණු කරනවා ඔවුන් හොඳින් ඉගෙන ගෙන තමන් දාර්ශනිකයන් කියා කියනවා. ඔවුන් මේ දේවල් තේරුම් ගෙන තම තමන්ව නිවැරදි කරගත යුතුයි. තමන් ග්‍රන්ථ රැසක් හදාරා තිබුණා වුණත් පරම පියා දැන් කියනා දේ තමයි හරි, අන් සියල්ල වැරදියි කියා කීමට ඔවුනට හැකි විය යුතුයි. පරම පියා පැමිණෙන මෙම ස්ථානය සැබෑම වූ වන්දනා ස්ථානයයි කියා ඔවුන්ට තේරුම් යා යුතුයි. මෙම දේශය ධාර්මිෂ්ට දේශයක් වශයෙන් හැඳින්වෙනවා. මෙහි තරම් ධාර්මිෂ්ට පුද්ගලයින් වෙන කොහේවත් නැහැ. ඔබ දානමාන රැසක් දී මහා පුණ්‍ය කර්ම කරනවා. ඔබ පරම පියාව අවබෝධ කර ගෙන තම ශරීරය, මනස හා ධනය සේවය සඳහා යොදවනවා. පරම පියා සෑම කෙනෙක්වම නිදහස් කරවනවා. ඔහු සෑම කෙනෙක්වම දුකින් නිදහස් කරවනවා. කිසිම ආගමික නායකවරයෙක්ට අන් අයව දුකින් නිදහස් කරවීමට බැහැ. මිනිස්සු කරන්නේ තම නායකයින්ව අනුගමනය කරමින් යාම පමණයි. සෑම කෙනෙක්ම තම තමන්ගේ චරිත රඟපෑම සඳහා පැමිණෙනවා. තම චරිත රඟපාන අතර ඔවුන් තමෝප්‍රධාන් වෙනවා. පසුව පරම පියා පැමිණ ඔබලාව සතෝප්‍රධාන් කරවනවා. එමනිසා, භාරතය එතරම් උසස් වන්දනා ස්ථානයක් වෙනවා. අංක එකේ උසස්ම දේශය භාරතයයි. පරම පියා කියනවා මේ මගේ උපන් ස්ථානයයි. මා මෙහි පැමිණෙන්නේ සැමට මුක්තිය ලබා දීමටයි. මම භාරතය දිව්‍ය ලෝකය බවට පත් කරවමි. එමනිසා, ඉමහත් වූ සෙනෙහසකින් පරම පියාව සිහිපත් කරන්න. අන් අය ඔබව දුටු විට, ඔවුනුත් එවැනිම ක්‍රියා කරාවි. සූක්ෂම හා දිව්‍යමය ක්‍රියා කියන්නේ මෙයයි. කිසිම කෙනෙක්ට කිසිම දෙයක් තේරෙන්නේ නැහැයි කියා සිතන්න එපා. ඔබගෙන් මේ පින්තූර ගැනීමට ඉදිරිපත් වන මිනිස්සු මතු වේවි. නැවක ගෙන යා හැකි ආකාරයේ ඉතාමත් හොඳ පින්තූර ඔබ සෑදිය යුතුයි. එතකොට නැව නවත්වන නවත්වන තැන් වල ඔවුන් ඒ පින්තූර ප්‍රදර්ශනය කරාවි. ඔබගේ සේවය විශාල වශයෙන් සිදුවිය යුතුයි. ඔබගේ නිදන් ගබඩාව පිරවීම සඳහා ත්‍යාගශීලී පුද්ගලයින් රැසක් බිහි වේවි. පැරණි ලෝකය වෙනස් කර නව ලෝකය ස්ථාපනය කරන්නේ කවුද

යන්න තේරුම් ගත හැකි වන ආකාරයෙන් ඔවුන් ඔබට සේවය කරාවි. මීට පෙර ඔබටත් තිබුණේ පිරිහුණු බුද්ධියකි. ඔබ දැන් ඉතාමත් පිරිසිදු බුද්ධියක් ඇති අය බවට පත් වෙලා. තමන් දැන් මෙම ලෝකය ඥානය හා යෝගා බලයෙන් දිව්‍ය ලෝකයක් බවට පත් කරවනවා කියා ඔබ දන්නවා. අන් සෑම කෙනෙක්ම ගොස් මුක්ති දේශයේ නතර වේවි. ඔබත් බලධාරීන් විය යුතුයි. ඔබලා අසීමිත පියාගේ දරුවනුයි, නැද්ද? ඔහුව සිහිපත් කිරීමෙන් ඔබට බලය ලැබෙනවා. පරම පියාට ලෝක සර්ව බලධරයා කියා කියනවා. ඔහු ඔබට සියලුම වේද ග්‍රන්ථ හා ආගමික ග්‍රන්ථ වල සාරය කියා දෙනවා. එමනිසා, සේවය සඳහා දරුවන් තුළ විශාල උද්යෝගයක් තිබිය යුතුයි. ඔබගේ දෙතොලින් ඥාන මිණිමුතු හැරෙන්න වෙන කිසිම දෙයක් පිට නොවිය යුතුයි. ඔබ සෑම කෙනෙක්ම රූප් හා බසාන්ට්වරුන්ය. මුළු ලෝකයට අළුත්ම අළුත් ලෝකයක් බවට නැවතත් පත් වන්නේ කෙසේද කියා ඔබට දැක ගත හැකි වේවි. සියල්ල අළුත් වෙනවා. එහි කිසිම දුකක් පිළිබඳ සඳහනක් නැහැ. පංච මහා භූතයන් පවා ඔබගේ සේවය වෙනුවෙන් කැප වී සිටිනවා. දැනට, මිනිස්සු නොවැදගත් අය බවට පත්ව සිටිනා නිසා අවැඩ කරනවා. පරම පියා දැන් ඔබව වැදගත් අය බවට පත් කරවනවා. අච්ඡා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. රූප් හා බසාන්ට් වන්න, එවිට නිරන්තරයෙන් ඔබගේ දෙතොලින් පිට වන්නේ මෙම ඥානයේ මිණිමුතු පමණයි. සේවය සම්බන්ධයෙන් උද්යෝගිමත්ව සිටින්න. ස්මරණයේ නිරතව සිටිමින් අන් අයටත් පරම පියාව සිහිපත් කරවන්න. මෙම දිව්‍යමය හා අසහාය කාර්යය කරන්න.
2. සැබෑ ආදරවන්තයෙක් බවට පත් වී ඒකායන ආදරවන්තයාට තමාව භාර කරන්න, එනම්, තමාව ඒ වෙනුවෙන් කැප කරවන්න. සැබෑ දීපාවලිය සිදුවන්නේ එවිට පමණයි.

**වරදානය:** ඔබ සියලු බල වලින් පිරීයාම තුළින් ලෝක අධිරාජ්‍යවරයෙකුගේ තත්ත්වය ඔබට හිමිවේවා.

**පාඨය:** එක් දුර්වලතාවයක් වුවද විශේෂතා බොහෝමයක් අවසන් කරයි. එබැවින් සියලු දුර්වලතා ඉවත දමන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබේ උසස් හැඟීම්, සුබ පැතුම්, උසස් ආකල්ප සහ උසස් සිතිවිලි තරංග මගින් ඕනෑම ස්ථානයක හිඳිමින් ඔබට මනස (මන්සා) තුළින් බොහෝ ජීවාත්මයන්ට සේවය කළ හැකිය. මේ සඳහා ක්‍රමය ප්‍රදීපාගාරයක් සහ බලාගාරයක් බවට පත්වීමයි. එය භෞතික පහසුකම් තිබීම, අවස්ථාවක් තිබීම හෝ කාලය පිළිබඳ ප්‍රශ්නයක් නොවේ. ඔබ ආලෝකයෙන් හා බලයෙන් පිරී සිටීම පමණයි සිදුවිය යුත්තේ.